**ශීර්ෂය - 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **මතය**

**------**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2** **මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපතිවාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්තන වැය විෂයක් හා මූලධන වැය විෂයයන් දෙකක් සඳහා වෙන් කරන ලද රු.2,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කාලපරිච්ඡේදය තුළ වැය නොකර ඉතිරි වී තිබුණි. | Covid-19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු අඩාල වූ බැවින්, නඩත්තු හා වත්කම් පුනරුත්ථාපන කටයුතු අපේක්ෂා කළ පරිදි ඉටු කර ගැනීමට නොහැකි විම. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතු වීම. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කල පසු රු.14,905,977 ක ඉතිරියක් පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 60 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | COVID වසංගත තත්වය හේතුවෙන් වාහන රාජකාරි කටයුතු සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ධාවනය නොකිරීම, බාහිර පාර්ශවයන් සමඟ පැවත්වීමට නියමිතව තිබූ දෙපාර්තමේන්තු හමුවීම් සිදු නොකිරීම හා ආයතන පරිශ්‍රය පිරිසිඳු කිරීමේ කටයුතු සඳහා බාහිර පාර්ශවයන් අත්හිටුවීම, කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන් අවලංගු කිරීම හා තාක්ෂණික උපදේශක විසින් ඉදිරිපත් කරන ලද වැඩ අවසන් කිරීම් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට සරිලන පරිදි අපේක්ෂිත මට්ටමේ නොතිබීම යනාදී කරුණු හේතුවෙන් නියමිත පරිදි ගෙවීම් සිදු කර නොමැත. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතු වීම. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කලයුතු වුවත් විගණනයට ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) වර්ෂය තුළ අත්තිකාරම් අයකර ගැනීම රු. 6,084,175 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණේ රු.2,988,659 ක් වීමෙන් රු.3,095,516 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ ගැටළුවක් තිබුණද එය අවසාන ප්‍රතිඵලයට බලපෑමක් නැත. තවද, ඉදිරියේදී අදාළ චක්‍රලේඛය නිවැරදි කර නියමිත ආකාරයට සියළුම රාජ්‍ය ආයතනවල අවසාන ගිණුම් සකස් කිරීම වෙනුවෙන් අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | නිවැරදි, නිශ්චිත උපදෙස් හා මාර්ගෝපදේශ නිකුත් කල යුතු වීම. |
| (ආ) අත්තිකාරම් ගෙවීම් රු.5,428,048 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු. 3,482,304 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු. 1,945,744 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

## 2.3 රජයේ නිලධාරීන් අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 දෙසැම්බර් 04 දින සේවය අතහැරයාමේ නිවේදනය නිකුත් කර තිබූ පර්යේෂණ සහකාර තනතුර දැරූ නිලධාරියෙකුගෙන් එදිනට අයවිය යුතු ණය ශේෂය රු. 132,846 ක් වූ අතර එදින සිට සේවය අතහැර ගොස් වසර 07 ක් ගතවී ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මෙම ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අසමත් වී තිබුණි. | මෙම ශේෂය වන රු. 132,846 අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 309/2018/DMR යටතේ නඩු පවරා ඇත. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |
| (ආ) | 2008 දෙසැම්බර් 17 වන දින මියගිය රාජ්‍ය කළමනාකරණ තනතුරක් දැරූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය මුදල රු. 164,953 ක් වූ අතර ඔහු මියගොස් වසර 12 ගතවී ඇතත් එම මුදල අයකරගෙන නොතිබුණි. | ණය මුදල ලබා ගන්නා අවස්ථාවේදී දේපළ ණය සුරැකුම් රක්ෂණාවරණය පැවති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවත්, පසුව එම ණය සුරැකුම් රක්ෂණය පැවති ජාතික රක්ෂණ භාර අරමුදලත් යන ආයතන ද්විත්වයම වගකීම ප්‍රතික්ෂේප කිරීම නිසා මිය ගිය නිළධාරියාගේ හිඟව පවතින ණය ශේෂය අයකර ගැනීම ප්‍රශ්ණගත වී තිබේ. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරාකරණය සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

## 2.4 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්

## 2.4.1 විවිධ අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 01 දිනට රු.160,584,098 ක් වූ විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය ප්‍රවර්තන වර්ෂය අවසාන වනවිට රු.160,106,800 ක් වී තිබුණි. ඒ අනුව එම හිඟ ශේෂයෙන් රු.477,299 හෙවත් සියයට 0.30 ක් පමණක් වර්ෂය තුලදී අය වී තිබුණි. | 2020 වර්ෂය තුළදී අදාල හිඟ ශේෂයෙන් අයවී ඇත්තේ රු.477,298.72 ක් වන බවත් එය හිඟ මුදලින් සියයට 0.30 වන ලෙස දක්වා තිබීම නිවැරදි වේ. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |
| (ආ) | ඉදිරිපත් කර තිබූ විවිධ අත්තිකාරම් ගිණුමෙහි 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 10 කට අදාළව සමස්ථ හිඟ අත්තිකාරම් ශේෂය රු.160,106,800 ක් වූ අතර ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තු 9 කම, හිඟ ශේෂය වූ රු.153,785,015 ක් වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන බව නිරීක්ෂණය විය. | මහා භාණ්ඩාගාරය විසින් සෘජුව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වී මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලබා දී ඇති අතර එම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අනෙකුත් ආයතන වෙත උප අත්තිකාරම් ලබාදීම සිදුකරන ලදී.<br><br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මෙහිදී අතරමැදියෙකු වශයෙන් පමණක් ක්‍රියා කරනු ලබන අතර, මෙම අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමේදී, නීතිමය ක්‍රියාමාර්ග අවසන් නොවීම, අත්තිකාරම් අයකර ගැනීම සඳහා අවශ්‍ය වන ලිපි ගොනු අස්ථානගත වීම හෝ විනාශ වීම, ඇතැම් ආයතන වර්තමානය වන විට අහෝසි වී තිබීම, ආර්ථික අපහසුතා මත පවත්වාගෙන යාම යනාදී කරුණු හේතුවෙන් හිඟ ශේෂ අයකර ගැනීමට නොහැකි වීම යන ප්‍රායෝගික ගැටළුවලටද මුහුණ දීමට සිදුව ඇති බව දන්වනු කැමැත්තෙමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2004/2005 වර්ෂවල වී මිලදී ගැනීම සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් ලග්ගල විවිධ සේවා සමුපකාර සමිතියට නිදහස් කළ මුදලින් ඉතිරි රු.2,183,000 ක ශේෂය 2020 ඔක්තෝබර් මාසයේ සිට රු. 10,000 ක් වූ මාසික වාරික වලින් අයකිරීමට කටයුතු කර තිබුණි. එසේ අයකර ගැනීම සිදු වුවහොත් ඉහත කී හිඟ මුදල අයවීමට ඉදිරි වර්ෂ 18 පමණ කාලයක් ගත වන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2020 වර්ෂයේදී ඉන් අයවී තිබුණේ රු.75,000 ක් හෙවත් සියයට 9 ක් පමණි. | ලග්ගල විවිධ සේවා සමුපකාර සමිතිය මේ වන විට ආර්ථික අපහසුතාවයන් මත පවත්වාගෙන යනු ලබන බව එම සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් දන්වා ඇති බව මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් මා වෙත දන්වා ඇත.<br><br>එසේම, ලග්ගල විවිධ සේවා සමුපකාර සමිතියට ලබාදුන් අත්තිකාරම් මුදලින් සමිතියේ පාලනයෙන් පරිබාහිර හේතු මත සිදුව ඇති රු.1,464,642.00 ක අලාභ කපා හැරීම සඳහා මු.රෙ.109 අයදුම්පත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇත. | -එම- |
| (ඈ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2006 වර්ෂයේදී ලබාදී තිබුණු වී මිලදීගැනීමේ අත්තිකාරම්වලින් 2014 වර්ෂයේ පැවති හිඟ ශේෂය වූ රු.12,560,031 කින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.1,793,880 පමණක් අය වී තිබුණි. ඒ අනුව තවදුරටත් හිඟ හිටි ශේෂය රු. 10,766,155 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල වෙත අත්තිකාරම් ලබාදීම සිදුකර ඇති බවත් එම ආයතන වෙතින් මුදල් අයනොවීම හේතුවෙන් බොහෝ ආයතන වෙත නඩු පවරා ඇති බවත් එම නඩු අවසන් වන තෙක් මුදල් අයකර ගැනීමට නොහැකි බවත් අපවෙත දන්වා ඇත. | -එම- |
| (ඉ) | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු. 349,475 ක ණය ශේෂය අයකරගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා කටයුතු කර නොතිබුණි. | රු. 349,477.50 ක මුදල නිරවුල් කරන ලෙස අදාල ආයතනය දැනුවත් කර ඇත. | -එම- |
| (ඊ) | සෞඛ්‍ය ,පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති අනුරාධපුර ශික්ෂණ රෝහලේ සේප්පුවේ තිබී 2019 මාර්තු 02 දින රු. 6,321,785 ක මුදලක් සොරාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මේ සම්බන්ධව විමර්ෂන කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් තවදුරටත් එම මුදල හිඟ ශේෂයක් ලෙස පැවතුණි. | මීට අදාල විධිමත් පරීක්ෂණය කඩිනමින් සිදුකර වගකිව යුතු අයගෙන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් විමර්ශන ක්‍රියාවලියෙන් පසු මේ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් අදාල ආයතනයට උපදෙස් ලබා දී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයට අදාලව අයවිය යුතුව පැවති හිඟ මුදල රු. 38,097,815 කින් 2020 දෙසැම්බර් 31 දින වනවිට හිඟ ශේෂය රු. 34,033,861 ක් වූ අතර 2020 වර්ෂය අවසානය වනවිට අයවීම් රු. 4,063,954 ක් හෙවත් සියයට 11 ක් විය. මේ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලියෙහි මන්දගාමී බවක් විගණනයට නිරීක්ෂණය විය. | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය හා විවිධ සේවා සමූපකාර සමිති වෙතින් නිරවුල් කළයුතු මුදල පිළිවෙලින් රු.12,971,207 හා රු. 21,062,654 කි. නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙතින් හා විවිධ සේවා සමූපකාර සමිති වෙතින් හිඟ මුදල් අයකර ගත හැක්කේ අදාල නඩු තීන්දු ලැබීමෙන් පසුව බව දන්වමි. | -එම- |
| (ඌ) | පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31දිනට පැවති හිඟ ශේෂය රු.55,927,666 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේ සමස්ථ හිඟ මුදලින් සියයට 35 ක් ලෙස ඉහලම ප්‍රතිශතය වී තිබුණි. ඉන් 2018 වර්ෂය තුල වී අලෙවි මණ්ඩලයේ කුරුප්පු හන්දියේ සහල් මෝල පැවැත්වීම වෙනුවෙන් වූ රු. 769,428 ක හා ආහාර කොමසාරිස් වෙත සහල් නිකුත් කිරීම වෙනුවෙන් වූ රු.13,018,114 ක අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 හා 113 අනුව කටයුතු කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යොමුකර ඇති බවත් දන්වා තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වී අලෙවි මණ්ඩලයේ වී මෝල පැවැත්වීමේ අලාභය වන රු.769,428 ක මුදල පොත්වලින් කපා හැරීම සඳහා අයදුම්පත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත යොමු කර ඇති අතර ආහාර කොමසාරිස් වෙත සහල් නිකුත් කිරීමේදී දැරීමට සිදුවූ රු.13,018,114 ක අලාභය කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ තොරතුරු ඇතුළත් වාර්තාවක් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් ලිඛිතව ඉල්ලුම් කර ඇත. | -එම- |
| (එ) | කොළඹ මහරෝහලේ දන්තායතනයේ 2002 ජනවාරි 22 දින සිදුවී තිබූ වැටුප් මංකොල්ලයට අදාලව අධ්‍යක්ෂ මහ රෝහල - කොළඹ වෙත ලබා දී තිබූ රු. 2,408,460 ක අත්තිකාරම් ශේෂය, 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගැනීමට හෝ අලාභ ලෙස පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණි . | කොළඹ දන්තායතනයේ සිදුවූ වැටුප් මංකොල්ලයට අදාලව මාළිගාකන්ද උසාවියේ නඩු අංක බී/67/02 යටතේ නඩුවක් විභාගවන අතර, විනය නියෝග අනුව චූදිත නිලධාරියාගේ වැටුපෙන් අයකරන ලද 5% ක මුදල රාජ්‍ය ආදායමට බැර කර ඇති බැවින් එම මුදල ආපසු ගෙන මෙම අත්තිකාරම් ගිණුමට බැර කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඒ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ සිට පැවත එන රු. 1,652,917 ක හිඟ ශේෂය නිරවුල් කිරීමට සතොස ආයතනයට මූල්‍ය හැකියාවක් නොමැති බව දන්වා තිබුණි. එමෙන්ම අදාල ශේෂය කපා හැරීම සඳහා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | සතොස ආයතනය වෙතින් අයවිය යුතු මුදල් අවශ්‍ය ලියකියවිලි රැස්කරමින් පවතින බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. | -එම- |
| (ඔ) | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.45,499,095 ක් වූ අතර එය සමස්ථ හිඟ මුදලින් සියයට 28 ක් විය. මෙම හිඟ ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව මෙතෙක් අපොහොසත් වී තිබුණි | ගෙවීම් පැහැර ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් නඩු කටයුතු හරහා අදාල මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වන බවත් කාරුණිකව දන්වමි.<br><br>ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත නොපමාව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති අතර ඊට අදාළ පසු විපරම් කිරීමට සටහන් කරගතිමි.<br><br>සතොස ආයතනය වෙතින් අයවිය යුතු මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර අවශ්‍ය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කර ඇත. | -එම- |
| (ඕ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 ජනවාරි 01 දිනට පැවති හිඟ ශේෂය වූ රු.1,441,687 න් 2020 දෙසැම්බර් 31 වන විට අයවී තිබුණේ රු.390,000 ක් හෙවත් සියයට 27 ක් පමණි. | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් අයවිය යුතු මුදල් මසකට රු. 30,000 බැගින් පියවීමට එකඟ වී ඇත්තේ අදාල විවිධ සේවා සමූපකාර සමිතිය ආර්ථික අපහසුතා මත පවත්වාගෙන යාම හේතුවෙනි. නමුත් මෙම මාසික වාරිකය සැලකිය මුදලක් දක්වා වැඩිකිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | -එම- |

### 2.4.2 වෙනත් ආණ්ඩු සඳහා අනුමත අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනය වෙත ඉදිරිපත් කල 2021 පෙබරවාරි 23 දිනැති පිළිතුරු ලිපිය අනුව බ්‍රිතාන්‍ය රජය වෙනුවෙන් ගෙවන ලද රු.1,242,947 ක්ද මැලේසියා රජය වෙනුවෙන් ගෙවන ලද රු.67,928 ක් ද ලෙස මුළු වටිනාකම රු. 1,310,875 ක් වූ විශ්‍රාම වැටුප් මුදල 2021 පෙබරවාරි 22 දින වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාල රු. 61,744 ක මුදල ප්‍රතිපූරණය කිරීම සඳහා මැලේසියානු භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව ඊ මේල් පණිවුඩයක් මඟින් අප වෙත දන්වා ඇත. | ප්‍රතිපූර්ණය කඩිනම් කල යුතුය. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයට අදාළ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව පොදු තැන්පත් ගිණුම් ආරම්භ කිරීම, ගිණුම් ගත කිරීම සඳහා උපදෙස් ලබාදීම හා වසාදැමීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය විය. ඒ අනුව තැන්පත් ගිණුම්වල පවතින හර ශේෂ නිරවුල් කිරීම සඳහා පියවර ගැනීම නිමවුම ලෙස හඳුනාගෙන තිබුණි. ඒ සම්බන්ධ පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ. | | |
| (i) පොදු තැන්පත් ගිණුම්වල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය (6003) තැන්පත් ගිණුම් 04 කට හා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු (6000) තැන්පත් ගිණුමකට අදාළව එකතුව රු. 10,943,683 ක් වූ හර ශේෂයන් පැවතුණි. | මෙම ශේෂ කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කල වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | අංක 243/2015 හා ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, 6003 කාණ්ඩයේ තැන්පත් ගිණුම් ශූන්‍ය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර 2016 වර්ෂයේ සිට එම කටයුතු වාර්ෂික ඇස්තමේන්තුව හරහා සිදු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එහෙත් අංක 6003 යටතේ වන තැන්පතු ගිණුම් 2 ක වසර ගණනාවක සිට පැවත එන රු. මිලියන 10.003 ක් වූ එකතු ශේෂයක් නිරවුල් නොකොට තවදුරටත් ඉදිරියට ගෙන යමින් පැවතුණි. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හර ශේෂය නිරවුල් කිරීම සම්බන්ධයෙන් ස්වදේශ අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇති කමිටුවේ වාර්තාව 2019.05.17 දිනැතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇති අතර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු මෙම හර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කෙරේ.<br><br>තවත් පොදු තැන්පත් ගිණුමක 2008 වර්ෂයේ දී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබූ හර ශේෂය ගිණුම්ගත කිරීම පිළිබඳව සොයාබලා ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස එම දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.<br><br>ගිණුම් 02 ක හර ශේෂය වන රු. 2,970 ක හා රු. 11,700 ක මුදල දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන අතර එම ශේෂයට අදාළ ආයතනය හෝ ශීර්ෂ අංකය සොයාගැනීමට නොහැකි හෙයින් 2021 වර්ෂයේ දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන සලසාගෙන පොත්වලින් කපාහැරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| | (iii) එසේම වසර 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකිරීම සඳහා උපදෙස් ලබාදීම, මේ යටතේ වූ තවත් නිමවුමක් ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද, නියැදි පදනම මත තෝරාගත් ආයතන 46 ක පැවති තැන්පතු ගිණුම් 125 ක තැන්පතු ගිණුම් ශේෂ අවුරුදු 02 සිට අවුරුදු 05 ට වැඩි කාලපරිච්ඡේදයක් දක්වා පැවත එන බව නිරීක්ෂණය වූ අතර එම ගිණුම්වල එකතුව රු. 2,854,732,825 ක් විය. | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත එවනු ලබන වාර්ෂික සැසඳුම් ප්‍රකාශයන් හා කාල විශ්ලේෂණ වාර්තා අනුව වර්ෂ 02 කට වැඩි ශේෂ පිළිබඳව මු.රෙ. 570 ප්‍රකාරව විශ්ලේෂණයන් සිදුකර ඊට අනුකූල නොවන තැන්පතු පිළිබඳව මු.රෙ. 571 ට අනුව කටයුතු කරන ලෙස අදාළ ආයතන වෙත උපදෙස් ලබා දී ඇත. එමෙන්ම, 2020.12.31 දිනට තැන්පතු ගිණුම් සම්බන්ධ වාර්ෂික සැසඳුම් වාර්තා පදනම් කර ගනිමින් වර්ෂ 02 කට වඩා වැඩි ශේෂ පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීමට ද දැනට සැලසුම් කර ඇත. | -එම- |
| | (iv) ඉහත පොදු තැන්පත් ගිණුම්වල ශුද්ධ ශේෂය තුළ පැවති තැන්පත් ගිණුම් 108 ක එකතුව රු. 1,937,815,718 ක ආරම්භක ශේෂ, 2020 වර්ෂය අවසාන වනවිටත් එසේම පැවතුණි. | නොකඩවා වර්ෂ කිහිපයක් අක්‍රීයව පවතින ශේෂ පිළිබඳව පසුවිපරම් කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇත. එමෙන්ම, අනෙකුත් ශේෂයන් පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීමට සටහන් කර ගතිමි. | -එම- |
| (ආ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව අත්තිකාරම් “බී” ගිණුම් අධීක්ෂණය කිරිම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ අතර එමගින් අපේක්ෂිත ප්‍රතිඵලය ලෙස හඳුනාගෙන තිබුණේ, කාර්යක්ෂම ගෙවීම් හා අයකිරීම් ක්‍රමයක් ඇති කිරිමටය. එසේ වුවද , නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි, ආයතන 102 කට අයත් වසර ගණනාවක සිට පැවත එන, අත්තිකාරම් “බී” ගිණුම්වල විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කල, සේවය හැරගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ට අදාල එකතුව රු.841,163,699 ක අය නොවන | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අදාළව අත්තිකාරම් "බී" ගිණුම් අධීක්‍ෂණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් ආයතන 10 ක් රඳවා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා කැඳවා රැස්වීම් පවත්වා ඇති අතර හිඟ ණය ශේෂ අයකිරීම පිළිබඳව පවතින ගැටලු නිරාකරණය සඳහා උපදෙස් ලබාදෙන ලදී. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ශේෂ පැවතුණි. මීට අදාලව දෙපාර්තමේන්තුව විසින් අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මගින් 2018 ජනවාරි 01 දින සිට ඉදිරියට විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ නිරවුල් කිරිමට අදාල උපදෙස් හැරෙන්නට මෑත කාලයේදි එම හිග ශේෂ අය කර ගැනිමට උපදෙස් ලබාදි තිබු බවක් විගණනයේදි නිරික්ෂණය නොවිය. | 2020.12.31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම් මේ වන විට ආයතන 10 කින් හැර අනෙකුත් සියලුම ආයතන වෙතින් ලැබී ඇති අතර එම ආයතනවල වාර්තාව මේ වන විට සකසා ඇති අතර පවතින වාතාවරණය තුළ රැස්වීම් කැඳවිය නොහැකි බැවින් ආයතන වශයෙන් වෙන වෙනම ලිපි යවා ඒ අනුව අයකිරීමේ ගැටළු පවතී නම් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමට සැලසුම් කර ඇත. | |
| (ඇ) | (i) | 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය වත්කම් යටතේ වූ රජයේ දෙපාර්තමේන්තුවලට අත්තිකාරම් ගිණුම් යටතේ රු. 15,783,074,603 ක ශුද්ධ ශේෂයක් පෙන්නුම් කෙරුණු අතර ඒ තුළ එකතුව රු. 16,081,884,989 ක් වූ හර ශේෂ ඇතුළත් විය. එසේම එම ශේෂය තුළ වසර ගණනාවක සිට නිරවුල් නොවී පැවත එන එකතුව රු. 1,353,073,051 ක ශුද්ධ ශේෂ ඇතුළත් විය. | රජයේ අමාත්‍යාංශවල අත්තිකාරම් ගිණුම් සඳහා ප්‍රතිපාදන සීමාවන් තීරණය කරනුයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විසර්ජන පනත මගිනි. අදාළ විසර්ජන පනත මගින් ලබාදෙන ගිණුම් අංක විවෘත කර දීම පමණක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබේ. | -එම- |
| | (ii) | එම ශුද්ධ ශේෂය තුළ ගිණුම් 06 කට අදාළ නිරවුල් නොවී පැවතුණු එකතුව රු. 19,940,017 ක් වූ බැර ශේෂ වසර ගණනාවක සිට පැවත එමින් තිබුණි. | දක්වා ඇති ශේෂයන් පිළිබඳව අදාළ ආයතන වෙතින් පසුවිපරම් කර, මු.රෙ. 518 අනුව කටයුතු කොට වසා දැමීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස උපදෙස් ලබාදීමට ඉදිරියේ දී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) 2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව, ඉදිරි වසර 10 ඇතුළත මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීම සඳහා යෝජනා සම්මත වී තිබුණු අතර ඒ සඳහා 2018 ඔක්තෝබර් 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහෙත් එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අදාලව ඉදිරිපත් කළ මාර්ග සැලැස්මේ (Road Map) ඇතුළත් කාර්යයන් වලට අදාල කාල රාමුව විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර තිබුණි. තවදුරටත් මේ සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) මූලික මාර්ග සැලැස්ම අනුව 2020 වර්ෂයේදීත් ,සංශෝධිත මාර්ග සැලැස්ම අනුව 2022 වර්ෂයේදීත් අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු රාජ්‍ය වත්කම් හඳුනා ගැනීම ,මැනීම් කිරීම හා හෙළිදරව් කිරීමට අදාල කාර්යයන් 2022 වර්ෂය අවසන් වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂාකර තිබුණි. ඒ අනුව, මේ යටත් ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව පමණක් අවධානය යොමුවී තිබුණු අතර ඉඩම් හා ගොඩනැඟිලි පවතින මධ්‍යම රජය ආයතන 214 ක් පවතින බවත් ඉන් 60 ක ඉඩම් හා ගොඩනැඟිලි නොමැති බවත් ඉන් සම්පූර්ණයෙන් තක්සේරු ගිණුම් ගත කර අවසන් ආයතන 10 ක් පමණක් බවත් විගණනයට දන්වා තිබුණි. ඒ අනුව, ඉඩම් හා ගොඩනැඟිලි පවතින ආයතන වත්කම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිශතය සියයට 07 ක් පමණක් වී තිබුණි. | රාජ්‍ය වත්කම් හඳුනාගැනීම, මැනීම් කිරීම හා හෙළිදරව් කිරීමට අදාළව ප්‍රමාණාත්මක ප්‍රගතියක් පෙන්නුම්කරන අතර ඒ අනුව 2019 වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම්වල අගය රුපියල් බිලියන 1,355 ක් වූ අතර 2020 වර්ෂයේ එහි අගය රුපියල් බිලියන 1,776 ක් විය. ඒ අනුව, 2020 වර්ෂයේ පැවති වසංගත තත්ත්වය හමුවේදී පවා රුපියල් බිලියන 421 ක වත්කම් ගිණුම්ගත කිරීමට හැකිවිය. ඒ අනුව, සංශෝධිත මාර්ග සැලැස්මට අනුව මෙම කාර්යය 2022 වර්ෂය අවසන් වන විට නිම කිරීමට අපේක්ෂිතය. | -එම- |
| (ii)මූලික සැලැස්ම අනුව 2020 වර්ෂයේදී අවසන් කිරීමට යෝජිතව තිබූ වගකීම් හඳුනාගැනීම ,මැනීම හා හෙළිදරව් කිරීමේ කාර්යය සංශෝධිත සැලැස්ම මඟින් 2022 දක්වා ප්‍රමාද කර තිබුණු අතර ඒ යටතේ වූ මූලික කාර්යයන් පමණක් මේ වනවිට ආරම්භ කර තිබුණි. | මාර්ග සැලැස්මේ ඇතුළත් වගකීම් හඳුනාගැනීමේ කාර්යයන් ආරම්භ කර ඇති අතර 2020 වසර තුළ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය තුළ එම කාර්යයන් නිම කිරීමට 2022 දක්වා දීර්ඝ කිරීමට සිදුවිය. එමෙන්ම, එම මාර්ග සැලැස්මේ ඇතුළත් | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ගෙවිය යුතු අයිතමයන් හඳුනාගැනීමේ කාර්යයන්හි කටයුතු මේ දක්වා ආරම්භ කර නොමැති අතර එම කාර්යයන් 2021 වසරේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. | |
| | (iii)මූලික මාර්ග සැලැස්ම අනුව 2021 වර්ෂයේ දී අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු ආදායම් හා වියදම් හඳුනාගැනීම, මැනීම හා හෙළිදරව් කිරීමේ කාර්යයන් සංශෝධිත සැලැස්ම මඟින් 2026 වර්ෂයෙන් පසුවට ප්‍රමාද කර තිබුණි. | සංශෝධිත මාර්ග සැලැස්ම අනුව උපචිත පදනම මත ආදායම් හා වියදම් හඳුනාගැනීම, මිනුම්කරණය හා හෙළිදරව් කිරීම 2026 වර්ෂයෙන් පසු පූර්ණ උපචිත පදනම යටතේ ගිණුම් තැබීමේ අවධියේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | -එම-. |
| | (iv)ඉහත කී අමාත්‍ය මණ්ඩල සටහන අනුව, සෑම වසරක් අවසාන වී මසකට පසු අදාළ ක්‍රියාවලින් ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතු වුවත්, මෙතෙක් එක් ප්‍රගතිය හෝ වාර්තා කර නොතිබුණි. | මෙතෙක් අදාළ ක්‍රියාවලියේ ප්‍රගතිය වාර්තා කර නොමැති බව පිළිගන්නා අතර මෙම වර්ෂය අවසානයේ දී අදාළ පරිදි ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | -එම- |
| (ඉ) | 2019 වර්ෂයේ අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ලබාදීමේ දූත මණ්ඩලය විසින් ලබාදුන් ක්‍රියාකාරී සැලැස්මේ 2020 අනුව දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන රාජ්‍ය මූල්‍ය තොරතුරු, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන (Government Finance Statistics) මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 4 ක රාජ්‍ය අංශයට අයත් සියලුම ව්‍යාපාර ආයතනවල මූල්‍ය තොරතුරු රැස් කරගැනීම හා ඒකාබද්ධ කරගැනීමට අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම 2020 වර්ෂයෙන් ආරම්භ කර සිදු කළ යුතුව තිබුණි. එහෙත් මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල එම කටයුතු ආරම්භ කර තිබුණද පළාත් පාලනවලට අදාළ එම කටයුතු මෙතෙක් ආරම්භ වී තිබුණු බව නිරීක්ෂණය නොවීය. | අන්තර් ජාතික මූල්‍ය අරමුදල ලබා දුන් ක්‍රියාකාරී සැලැස්ම 2020 වසර වෙනුවෙන් පමණක්ම ලබා දුන්නක්, නොවන අතර 2020 වසරේ රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් පළාත් පාලන ආයතන වලට අදාල කටයුතු ආරම්භ කිරීම ප්‍රායෝගිකව අපහසු විය. | -එම- |